**චක්‍රලේඛ අංකය: 05/2014**

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/1/2012

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail info@rgd.gov.lk, rg@rgd.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.rgd.gov.lk

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
## பதிவாளர் நாயகத் திணைக்களம்
## REGISTRAR-GENERAL'S DEPARTMENT

### ප්‍රධාන කාර්යාලය
### தலைமை அலுவலகம்
### HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date: 2014/04/

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

<u>**විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන්ට ගෙවන ගාස්තු සංශෝධනය කිරීම**</u>

විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේදී සහ එම සහතිකවල සහතික පිටපත් නිකුත් කිරීමේදී මහජනතාවට වඩාත් කාර්යක්ෂම සහ ගුණාත්මක බවින් ඉහල සේවයක් සැපයීමේ ප්‍රධාන අරමුණ ඇතිව විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම වෙනුවෙන් රෙජිස්ට්‍රාර්වරුන්ට ගෙවන ගාස්තු ඉහල නැංවීමට තිරණයකර ඇත.

02. ඒ අනුව විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන්ට ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් සහ දෙවන පිටපත් බාරදීම ප්‍රමාදවීම් සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති සියළුම චක්‍රලේඛ මෙයින් අවලංගු කරමි. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ අනුමැතිය අනුව 2014/01/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම ගාස්තු පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | කාරණය | | ගාස්තුව රු. |
|---|---|---|---|
| I. | එක් උපතක් හෝ මරණයක් ලියාපදිංචි කිරීම සඳහා | | 75.00 |
| II. | ලිපිද්‍රව්‍ය දීමනාව - එක් මසකට | | 500.00 |
| III. | කාර්යාලීය දීමනාව - එක් මසකට | මහ නගර/නගර සීමාව තුළ | 1000.00 |
| | | ප්‍රාදේශීය සභා සීමාව තුළ | 750.00 |

03. විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් විසින් ලියාපදිංචි කරන සෑම ලේඛනයකම දෙවන පිටපත් සහ මාසික වාර්තා ඊළඟ මාසයේ 05 වන දින වන විට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට භාර දිය යුතු බැවින්, නියමිත දිනට එම ලේඛන තමන් වෙත ගෙන්වා ගැනීමට ඔබ විසින් සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතුය. ප්‍රමාද වී භාර දෙන සෑම ලේඛනයක් සඳහාම ප්‍රමාද ගාස්තුවද දිනකට රු. 5.00ක් වශයෙන් සංශෝධනය කර ඇත. එබැවින් රෙජිස්ට්‍රාර්වරුගේ ගාස්තු ඉල්ලීමේ වවුචරපත් නිර්දේශ කර ඉදිරිපත් කිරීමේදී දෙවන පිටපත් භාර දීමේ ලේඛනය අනුව අදාල ප්‍රමාද ගාස්තු අවකරණය කර ඉදිරිපත් කිරීමට කරුණාකර පියවර ගන්න.

04. විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන්ට ගාස්තු ගෙවීමේදී මෙම චක්‍රලේඛ උපදෙස් තරයේ අනුගමනය කරන ලෙස නැවතත් කාරුණිකව අවධාරණය කරමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ජී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්
1. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය - කා.දැ.ගැ.ස.
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - අ.ක.ස.
3. ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන කාර්යාලය - අ.ක.ස.
4. කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - අ.ක.ස.
5. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.